# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2063/46 – 2018 මාර්තු 23 වැනි සිකුරාදා – 2018.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, බැරගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එම්එල්ටී/2016/246 හා 2017.07.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – කෝන්ගහවත්තදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0175**
උතුරට: කුසුමාවතී හේවාපතිරන හිමිකම් කියන කෝන්ගහවත්ත සහ අමරසේන සමරසිංහ හිමිකම් කියන කෝන්ගහවත්ත; නැගෙනහිරට: අමරසේන සමරසිංහ හිමිකම් කියන කෝන්ගහවත්ත; දකුණට: කැබලි අංක 2; බටහිරට: කුසුමාවතී හේවාපතිරන හිමිකම් කියන කෝන්ගහවත්ත.

02. **කැබලි අංක 02 – කෝන්ගහවත්තදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0323**
උතුරට: කැබලි අංක 1 සහ අමරසේන සමරසිංහ හිමිකම් කියන කෝන්ගහවත්ත; නැගෙනහිරට: අමරසේන සමරසිංහ හිමිකම් කියන කෝන්ගහවත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අංක 3; බටහිරට: කැබලි අංක 3 සහ කුසුමාවතී හේවාපතිරන හිමිකම් කියන කෝන්ගහවත්ත.

03. **කැබලි අංක 03 – කෝන්ගහවත්තදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.0282**
උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ පල්ලේ දොළ; බටහිරට: පල්ලේ දොළ සහ කුසුමාවතී හේවාපතිරන හිමිකම් කියන කෝන්ගහවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2015/පීසී/234.
2018 ජනවාරි මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04 – 362